00035

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන -පස්වන මට්ටම 2014/2015

අවසාන පරීක්ෂණය - 2016

අධ්‍යාපනයේ උපදේශනය හා මාර්ගෝපදේශනය – ESU3128

කාලය : පැය (03) තුනයි.

---

දිනය - 2016 අප්‍රේල් 07 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද,2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. අවිධිමත්ව පැවති සහය සැලසීමේ ක්‍රියාවලිය වෙනුවට විද්වත් වෘත්තික උපදේශන සේවයක් සමාජය තුළ ස්ථාපිත වීමට බලපෑ හේතු තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ළමයින් තුළ සමායෝගී ගැටළු සංවර්ධනය වීමට පාසල් ගුරුවරුන් ආශ්‍රිත සාධක බලපාන ආකාරය උදාහරණ දෙකක් (02) ඇසුරින් දක්වන්න.

03. ඉගෙනුම් දුෂ්කරතා ඇතිවීමට බලපෑ හැකි සමවයස්කයින් ආශ්‍රිත සාධක තුනක් (03) උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

04. පාසල් උපදේශනය අඛණ්ඩ ක්‍රියාවලියක් විය යුත්තේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

05. එලි ගින්ස්බර්ග් ඉදිරිපත් කරන ලද වෘත්තිය සංවර්ධන අවධි මාලාව රූප සටහනක් ආශ්‍රයෙන් දක්වන්න.

06. නිරීක්ෂණ සැසියක තොරතුරු වාර්තා ගත කරන ආකාර තුනක් (03) පැහැදිලි කරන්න.

07. 'සුහඟ සහ සහජ දක්ෂතා සහිත ළමයින් පන්ති කාමර තුළ ඉගෙනුම් දුෂ්කරතාවයනට මුහුණ දීමට ඉඩ ඇත.'

    උක්ත ප්‍රකාශය කරුණු දෙකක් (02) ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

08. මන්ද මානසික ළමයින් ඉගෙනුම තුළ පෙන්වන සීමාකම් තුනක් (03) පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) උපදේශනය හා මාර්ගෝපදේශනයට අදාළ ප්‍රධාන මාන හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) වෘත්තිය උපදේශනය හා මාර්ගෝපදේශන සේවා පාසලක් තුළ සැපයීමේදී භෞතික හා මානව පහසුකම් ඵලදායී ලෙස භාවිත කළහැකි ආකාර තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 12)

10. (i) මාර්ගෝපදේශනයට වඩා උපදේශනය විද්‍යාත්මක ක්‍රියාවලියක් ලෙස සලකන්නේ මන්ද ? (ලකුණු 08)

(ii) උපදේශනය සඳහා විද්‍යාත්මක පදනමක් සපයන ප්‍රවේශ පහක් (05) දක්වා ඉන් එකක මූලික අදහස පැහැදිලි කරන්න. (ලකුණු 12)

11. 'සමාජ වෙබ් අඩවි අද වන විට සිසුන්ගේ එදිනෙදා ජිවිතයේ ප්‍රධාන අංගයක්' බවට පත්ව ඇත.

i. මෙම වෙබ් අඩවි නිරන්තර භාවිතය ශිෂ්‍යය ඉගෙනුමට බලපාන ආකාරය විභාග කරන්න. (ලකුණු 10)

ii. මෙවැනි ව්‍යවහාරයන් ඵලදායිව කළමනාකරණය සඳහා ඔබ සිසුන්ට උපදෙස් දෙන්නේ කෙසේ ද? (ලකුණු 10)

12. i. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ට උපදේශනය හා මාර්ගෝපදේශනය අවශ්‍ය බව සාධාරණීකරණය කිරීමට හේතු හතරක් (04) දක්වන්න. (ලකුණු 10)

ii. විශේෂ අවශ්‍යතා සහිත ළමයින් වැඩ ලෝකයට සංක්‍රමණය කරවීම සඳහා උපදේශකයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 10)

13. i. ළමයින් තුළ දක්නට ලැබෙන චර්යා ගැටලු තුනක් (03) පරීක්ෂා කරන්න. (ලකුණු 10)

ii. ළමයින්ගේ තුළ පැවතිය හැකි එම චර්යා ගැටලු කළමනාකරණය සඳහා ඔබ ගන්නා ක්‍රියා මාර්ග මොනවා ද? (ලකුණු 10)

14. පහත ඕනෑම මාතෘකා දෙකක් (02) යටතේ කෙටි සටහන් ලියන්න.

(i) දෘෂ්ඨි ඌනතා සහිත සිසුන්ගේ ඉගෙනුමට පහසුකම් සැලසීම සඳහා භාවිත කළ හැකි උපාය මාර්ග

(ii) උපදේශනය හා මාර්ගෝපදේශනය අතර වෙනස්කම් තුනක් (03)

(iii) 'පාසෝනියන් ආකෘතිය' තුලින් රැකියා සොයන්නන්ට සහාය වීම

(iv) විමධ්‍යගත පාසල් උපදේශන හා මාර්ගෝපදේශන සංවිධාන ව්‍යුහය.

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.